# Asian Productivity Organization
# “The APO in the News”

Name of publication: Rivira (19 June 2014, Sri Lanka)

# වතු ආශ්‍රිතව සිදුවන මාතෘ මරණ සංඛ්‍යාව ශීඝ්‍ර ලෙස ඉහළ යනවා

## ගම්පොළ ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍ය නවාස් ජිෆ්රි

පී.ඒ. රාජනායක-ගම්පොළ

මෙරට වතු ආශ්‍රිතව සිදුවන මාතෘ මරණ සංඛ්‍යාව ශීඝ්‍ර ලෙස ඉහළ යමින් පවතින බව ගම්පොළ ශික්ෂණ රෝහලේ ප්‍රසව හා නාරි විශේෂඥ වෛද්‍ය නවාස් ජිෆ්රි මහතා සඳහන් කරයි.

ශ්‍රී ලංකා ප්‍රසව හා නාරි වෛද්‍ය සංගමයේ 2014 වසරේ දැක්ම හා ඉලක්කය වී ඇත්තේ ලංකාවේ මාතෘ මරණ සංඛ්‍යාව බින්දුව දක්වා අඩුකිරීම වුවත් වතුකරයේ මාතෘ මරණ අඩු නොකොට මෙම ඉලක්කය සපුරාගත නොහැකි බවද ඒ මහතා පෙන්වා දෙයි.

වතුකරයේ මාතෘ හා ළමා මරණ අවම කිරීමේ නව ක්‍රමයක් හඳුන්වා දීම සඳහා ගම්පොළ උඩපළාත ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල දේශන ශාලාවේ පැවැති දැනුම්වත් කිරීමේ සම්මන්ත්‍රණයකදී ඒ මහතා මේ බව අවධාරණය කළේය.

වැවිලි මානව සංවර්ධන භාරයේ මහනුවර කලාපයේ අධ්‍යක්ෂ අතුල සේනාරත්න, සෞඛ්‍ය කළමනාකාර වෛද්‍ය තුෂාර ප්‍රනාන්දු යන මහත්වරුන්ගේ සහයෝගය මත පුස්සැල්ලාව වැවිලි සමාගමේ සාමාන්‍යාධිකාරී චමින්ද සේනාරත්න යන අයගේ සහයෝගයෙන් ගම්පොළ පුස්සැල්ලාව සොගමා හා රොත්චයිල්ඩ් යන වතු දෙක තුළ මෙය ප්‍රථමයෙන් ක්‍රියාවට නැංවීමට සැලසුම් කොට තිබේ.

වැඩිදුරටත් අදහස් දැක්වූ වෛද්‍ය නවාස් මහතා මෙසේද කීය.

"නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පසුගිය වසර 10 පුරාවට සිදුවූ මාතෘ මරණ සංඛ්‍යාවෙන් සියයට සියයක්ම පාහේ සිදුව ඇත්තේ වතු ආශ්‍රිතවයි. මෙය නවීන ලෝකය තුළ පිළිගැනීමට තරමක් අපහසු දෙයක් වුවත් එහි සත්‍යය අනුව එය කාගෙත් සිත් සසල කරවන කරුණකි. 2009 වසර තුළ නුවරඑළියේ සිදුවූ මාතෘ මරණ පහළොවම වතු ආශ්‍රිත මව්වරුන්. ඒ වගේම අනෙකුත් වසර තුළත් එලෙසමයි. පසුගිය 2014 වසරේත් සිදුව ඇති මාතෘ මරණ විස්සෙන් 18ක්ම වතු මව්වරුන්. මෙය නම් ඇත්ත කතාව. මෙම තත්ත්වයට බලපා ඇති හේතු ගණනාවක් ඇතත් ප්‍රධාන හේතුව වන්නේ ඔවුන්ගේ නොදැනුවත්භාවය හා නීරක්තියයි. ඒ අනුවයි අප ඔවුන්ට දැනුම කළමනාකරණය සහ නවකරණය තුළින් පූර්ණ ඵලදායීතාවක් ඇතිකර ගන්නා හැටි කියාදෙන්න යන්නේ.

අධික නීරක්තියෙන් පෙළෙන මේ වතු මවකට හිමොග්ලොබින් එකක් (රතු රුධිරාණු) දුන්නොත් දවසට තේ දලු කිලෝ විස්සක් නෙළන ඇයට අමතර ශක්තිය නිසා එය කිලෝ විසි දෙක දක්වා වැඩිකර ගන්න පුළුවන්. ඒ විතරක් නොව නීරක්තිය නොමැති වීම නිසා නිසි ලෙස මොළය ක්‍රියා කිරීම තුළින් ඇය නිවැරදි තේ දල්ල කැඩීම නිසා එහි ගුණාත්මකභාවයද ඉහළ යනවා.

ඒ අනුව කළ පර්යේෂණයට අනුව ඇයට ලැබෙන අමතර ආදායම වගේම සමස්ත දේශීය තේ නිෂ්පාදනයේ ලාභයත් 35.03% වෙනවා. මේ අනුව අප රටේ ආර්ථිකයද ඉහළ නැංවෙනවා.

වතුකරයේ මාතෘ මරණවලට තවත් හේතුවක් වී ඇත්තේ පුරුෂයාගේ අධික බීමත්කමෙන් කාන්තාව හිරිහැරවලට භාජනය වීමයි. මේ හේතු නිසා වතුකරයේ කාන්තාවන් ශරීරයට ගිනි තබා ගැනීම බහුලයි. සමාජයේ නියම පිරිමියා යනු කාන්තාවක් දූෂණය කරන කෙනා හෝ ඇයට හිරිහැරයක් කරන කෙනා නොවේ. ඇය ආරක්ෂා කරන කෙනායි. මොකද නියම පිරිමියාගේ මවද කාන්තාවක් නිසයි."

මෙම අවස්ථාවට මධ්‍යම පළාත් ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය ගාමිණී ජයකොඩි, මහනුවර සෞඛ්‍ය අධ්‍යක්ෂ නිලාති ප්‍රනාන්දු, ආසන ඵලදායිතා සංගමයේ වෛද්‍ය ආචාර්ය ප්‍රභා නායර්ද, ගම්පොළ ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය සරත් වීරබණ්ඩාර යන මහත්ම මහත්මීන් ඇතුළු පවුල් සෞඛ්‍ය සේවිකාවන්, වෛද්‍යවරුන් ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.



ප්‍රසව හා නාරි වෛද්‍ය විශේෂඥ නවාස් ජිෆ්රි මහතා සභාව ඇමතූ අයුරු සහ සහභාගි වී සිටි වෛද්‍යවරුන් හා පවුලේ සෞඛ්‍ය සේවිකාවෝ